# ස.ණ.ස. පුවත් කොළඹින්

coop

2019 - නොවැම්බර් - එකලොස්වන කලාපය

දායකත්වය රු 15/-











## සමුපකාරය අර්ථක්‍රමයකි. නිලබලය හා ධනබලය ඇත්තන්ට එය නොතේරේ.

**සමුපකාර නායක සමුපකාර ප්‍රසාදිනි ඩැනිසන් වීරසූරිය**

පුද්ගල හා රාජ්‍ය ව්‍යවසාය ක්‍රමය කෙරෙහි පමණක් ජනතාවගේ ජීවන තත්වය උසස් කළ යුතු යයි නෙසිතා සමුපකාර ක්‍රමයෙන් සැලකිය හැකි සේවාවන් ජනතාව විසින්ම එක්ව ඔවින්ගේ අභිවෘද්ධිය සඳහා සමුපකාර මෙහෙයවීම කෙරෙහි රජයක අවධානය යොමු විය යුතුවේ. රට සංවර්ධනය කිරීම සඳහා රාජ්‍ය හා පුද්ගලික ව්‍යවසායට අමතරව ඇති වඩාත් යහපත් පිළියම වන්නේ සමුපකාර අංශය රටක ප්‍රවර්ධනය කිරීමය. ඒ නිසා සමූහයක් වශයෙන් එක්ව ඔවුන්ම මූලධනය සම්පාදනය කර ගනිමින් සුලු හා මධ්‍ය පරිමානයේ කටයුතු ඉටු කර ගැනීමට ඇති ලොව පිළිගත් මහජන සංවිධානය වන සමුපකාරය ප්‍රවර්ධනය කිරීම අවශ්‍ය වන්නේ රජයේ මූලික යුතුකම් මිනිසුන් විසින්ම එක්ව ඉටු කරගන්නා ක්‍රමයක් බැවිනි. මේ නිසා 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 'රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූල ධර්ම' (Principles of State Policy) යටතේ වූ 16(2) (ඉ) වගන්තියට පෞද්ගලික අංශයට අමතරව රාජ්‍ය අංශය හා සමුපකාරය වර්ධනය කිරීම පිළිගෙන ඇතුලත් කර තිබූ නමුත්, වත්මන් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 27(2) (ඇ) යටතේ ඇතුලත්ව ඇත්තේ රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය පමණක් බව පෙන්වා දෙමි. එයට සමුපකාර අංශය ඇතුළත් කළ යුතුය.

සමුපකාරයට යෝග්‍ය නෛතික පරිසරය හා ශක්තිමත් කිරීමේ අවකාශය සලසා දීමේ අටියෙන් විවිධ වකවානුවල කොමිෂන් සභා පත් කොට වාර්තා ලබා ගත්තද ඒවා ක්‍රියාත්මක නොකිරීම සෑම රජයක්ම අනුගමනය කළ ප්‍රශ්න යටපත් කිරීමේ උපායක්ම විය. 2002 වර්ෂයේදී ශ්‍රී ලංකා සැසි වාර්තාවක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති මහාචාර්ය ජේ.එම්. ගුණදාස මහතාගේ සභාපතිත්වයෙන් වූ සමුපකාරය පිළිබඳව විමර්ශණය කිරීමේ ජනාධිපති පරීක්ෂණ කොමිෂමේ

*07 පිටුවට...*

## වාර්ෂික චාරිකාව - නැදිමාල



නැදිමාල සණස සමිතියේ 'සඳකිරණ' ළමා සමාජයේ වාර්ෂික චාරිකාව පසුගිය දා සිදුවිය. එහිදී ළමා කමිටුවේ දරු දැරියන් හා කාන්තා කමිටු සාමාජිකාවන් පින්නවල අලි අනාථාගාරය හා සරදියෙල් ගම්මානය නරඹා ආදිවාසී ජන ජීවිතය මෙන්ම සරල දිවිපැවැත්ම පිළිබඳ මනා දැනීමක් ලබාගත්හ.

**චාන්දනි පුෂ්පකුමාරි - වාර්තාකාරිනී**

## නව අධ්‍යක්ෂවරුන් පත්වේ

2019 ඔක්තෝබර් මස 20 දින පැවති මහා සභා රැස්වීමේ දී නව අධ්‍යක්වරුන් 7 දෙනෙකු පත් කර ගැනීමත් සමග වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය මෙසේය.

**ගරු සභාපති :-** ඩැනිසන් වීරසූරිය මහතා - කරගම්පිටිය කවුඩාන සණස

**ගරු අධ්‍යක්ෂවරු :-**

| | |
|---|---|
| ජයන්ති නවරත්න මෙනවිය | කාන්තා නායිකාව ගොඩිගමුව දකුණ සණස |
| බී. සුනිල් ප්‍රියලාල් මහතා | දකුණු රත්මලාන සණස (මොරටුව) |
| ඒ.ඩී. ආරියපාල මහතා | මල්පුර සණස (කොලොන්නාව) |
| ඩබ්.ඒ. ආරියරත්න වීරසිංහ මහතා | නැගෙනහිර මාලබේ සණස (කඩුවෙල) |
| එම්. ලයනල් ගුණරත්න මහතා | මුල්ලේගම සණස (හෝමාගම) |
| එච්.පී. රණසිරි කල්දේරා මහතා | මකුලුදූව නාම්පමුණුව ප.ගො සණස (කැස්බෑව) |
| ප්‍රේමරත්න මනතුංග මහතා | මහරගම සණස (මහරගම) |
| කේ. පියසීලි හේමලතා මහත්මිය | සීතාපුර සණස (හංවැල්ල) |
| වී.අයි. මධුවන්ත පෙරේරා මහතා | නැගෙනහිර කවුඩාන සණස ( දෙහිවල-ගල්කිස්ස) |
| එච්. කාන්තිනී පෙරේරා මහත්මිය | පොල්හේන්ගොඩ සණස (කොළඹ) |
| එම්.ඩී. සරත් ගුණවර්ධන මහතා | වග නැගෙනහිර සණස ( පාදුක්ක) |

නුගේගොඩ කලාපයට ඉදිරියේ දී පත්කර ගැනීමට නියමිතය.

2019.09.29 දින පැවති මහා සභා රැස්වීමෙන් මෙම නව පත් කිරීම් සිදු කරනු ලැබුවේ යෝජනා යටතේ මහා සභාවට ඉදිරිපත් වූ යෝජනාවක් 168 ක් පැමිණි මහා සභාවේ 16 දෙනෙකුගේ විරුද්ධව 152 දෙනෙකුගේ එකඟත්වයෙන් සම්මත වීම නිසාය.

මෙම මහා සභා රැස්වීමේ දී 2010 වර්ෂයේ ඇස්තමේන්තු කළ ආදායම් ප්‍රකාශය, තැන්පත් හා ණය ආයෝජන සැලැස්ම, ආයතනික ක්‍රියාකාරකම්, පුහුණු සැලැස්ම, ආරක්ෂණ ක්‍රමවල දායකත්වය වැඩි කිරීම අනුමත කිරීම මෙන්ම, ස්ත්‍රී පුරුෂ සමාජත්ව අන්තර්ග්‍රහණය පිළිබඳ කොළඹ දිස්ත්‍රික් සණස ප්‍රතිපත්තිය සහ පස් අවුරුදු සැලැස්ම තුළ වූ අධ්‍යාපන පුහුණු, මූල්‍ය සේවා, නියෝජිත සේවා, විමර්ෂණ හා සමජයීය වගකීම් යටතේ වූ වැඩ සටහන් ද සාකච්ඡාවට ලක් කොට අනුමත කරන ලදී.


AIR CONDITIONED
SADEEPA RECEPTION HALL
වායු සමීකරණය කල
සදීපා උත්සව ශාලාව
PLEASE INQUIRE FOR ALL YOUR FUNCTIONS
ඔබගේ සියළුම
උත්සව කටයුතු සඳහා විමසන්න.





ස.ණ.ස. සාමාජිකයින් සඳහා විශේෂ අයකිරීම්
පාසැල් මාවත, තලවතුගොඩ, පන්නිපිටිය.
විමසීම්: 0112774238/ 0113883837


## සී/ස කොළඹ දිස්ත්‍රික් සණස සමිති සංගමයේ ගරු සභාපතිතුමා විසින් නිකුත් කළ විශේෂ නිවේදනයයි

සංගමයේ සාමාන්‍යාධිකාරී ධුරයේ කටයුතු කළ තුසිත් කුමාර වීරවර්ධන මහතාගේ සේවය 2019.09.30 දින අත්හිටුවා ඇති බව සියලුම සාමාජික සමිති වෙත මෙයින් දන්වා සිටිමු. නව සාමාන්‍යාධිකාරීවරයා වශයෙන් ලක්ෂ්මන් අමරතුංග මහතා වැඩ ආවරණය කරනු ලබන අතර, සංගමයේ ලේකම් වරයා ලෙස තිලක් හත්වැල්ල මහතා පත් කර ඇති බව ද නිවේදනය කරමු.

# කියවන්න, ලියන්න



සංනිවේදන ක්‍රියාවලිය එක කණ්ඩායමක ක්‍රියාවක් නොවේ. ග්‍රාහකයා විසින් දක්වන ප්‍රතිචාරය තුළින් ලැබෙන පෝෂණය, සංනිවේදන ක්‍රියාවලියේ ඵලදායක බවත්, ගුණාත්මක බවත්, තීරණය කෙරේ.

අනෙකුත් සංනිවේදන ක්‍රියාවන් තුළදී මෙන් නොව, ජනමාධ්‍ය ඇසුරෙන් ලැබෙන ප්‍රතිචාර ඒකපාක්ෂික නොවීමට වගබලා ගැනීමෙන්, පිරිහීමට ලක් නොවී ප්‍රේක්ෂකයාගේ සිතිවිළි දිනාගත යුතුවේ. මුද්‍රිත මාධ්‍යයක් වූ 'සණස පුවත් කොළඹින්' පාඨක අවශ්‍යතාවය හදුනාගෙන ඊට සරිලන පිටු සැකසුමෙන් යුතුව දසක දෙකකට වඩා කාලයක් තුල ක්‍රමයෙන් ඉදිරි ගමනක යෙදී ඇත.

'සණස' ට ආවේණික පුවත් පෙරටු කොට ග්‍රාමීය සමිති හී ක්‍රියාකාරිත්වය, ප්‍රවෘත්ති පළ කිරීම මගින් එම සමිති සදහා උත්තේජනයක් ලබා දෙන අතර, ශාස්ත්‍රීය ලිපි පෙළගස්වා පාඨකයා දැනුවත් කරවීමට ප්‍රකාශන කමිටුව ගන්නා උත්සාහය පිළිබඳව විවිධ කෝනයන්ගෙන් බලන පිරිස්ද නැත්තේ නොවේ.

රුචිකත්වය විවිධය, සාහිත්‍ය කලාවට ආගමික සම්බන්ධතා ඈත ඉතිහාසයේ සිට පැවත එන්නේ ගැමියාගේ ආකල්ප හා ගුණ සුවඳ හා මුසුවය. කවියක් ගීතයක් වීමට වචන ප්‍රබන්ධය බොහෝ සේ බලපාන්නා සේම සැදැස් නිසදැස් මගින් ලේඛකයා වැකි අමුණා ඉදිරිපත් කිරීමේදී පාරම්පරික සමාජ ධර්මතා මගහැරිය නොහේ. සණස පාඨක පිරිස ළමා, තරුණ, මැදිවිය මෙන්ම වෘධ වයස් සීමාවන් තුළ හැසිරෙන්නෝ වෙති. එසේම විවිධ විෂයය පද්ධතීන්ට ඇළුම් කරන්නෝ වෙති. ඒ නිසාම මධ්‍යස්ථ ප්‍රකාශනයක් සේ අප පිළියෙල කරන සණස මාසික ප්‍රකාශනය, හුදෙක් පාඨක වාර්තා මතපදනම් කර ගැනීමෙන් අප අතර ඔවුන් රදවා ගැනීමට හැකි වී තිබේ.

නව දෘෂ්ඨී කෝනයන්ගෙන් සැකසුම සකස් වෙද්දී දෙනෙතට ප්‍රිය මනාප වූ චිත්‍රයන් සේම ඡායා රූප වලින්ද පිටු ගැවසිය යුත්තේමය. බොළඳ රසිකත්වයට නතු වූ ග්‍රාහකයෙකුට වඩා විචාරශීලීව ප්‍රතිචාර දක්වන පාඨකයින් මාධ්‍යයේ දියුණුවට අවශ්‍ය වේ. සමුපකාරික ඔබට 'සණස පුවත් කොළඹින්' සෑම මසකට වරක් ලබාදෙන පුංචි තිළිණය, ප්‍රකාශනයේ අන්තර් ගත කරුණක් අලලා ප්‍රශ්ණයක් ඉදිරිපත් කිරීමෙන් බලාපොරොත්තු වෙන්නේ කියවීමේ රුචිකත්වය ඇති කරවීමටයි.

සමුපකාර විෂය පිළිබඳ දැනුම හා නීතිරීති මෙන්ම ව්‍යවස්ථා හා මහසභාව පැවැත්වීම කාරක සභා තීරණ ගැනීම මූලික කරගත් විශේෂිත කාරණා ඇතුලත් තොරතුරු ඔබට ලබාදෙන්නට ලිවීමේ හැකියාව ඇති සාමාජිකයින්ට විවෘතව ඇති බව සණස පුවත් මතක් කර දෙන්නේ, විවෘත මනසකින් යුතුවය. කියවීමට හුරුවී, ලියන්නට පෙළඹී හෙට දිනයේ සණස ප්‍රකාශනයට ආලෝකය තීව්‍ර කරවීමට ඇරයුම් කරමු.

## ස.ණ.ස. පුවත් කොළඹින්

☆ **අධීක්ෂණය**
ඩී. වීරසූරිය

☆ **ප්‍රකාශන කමිටුව**
එම්.ඩී. ජිනදාස
හේමසිරි බෙනරගම
එම්.රොහාන් ජේ. පෙරේරා
යු.ඩී.එස්. වීරසිංහ

☆ **විධායක සහාය**
නාලක ජයසූරිය

☆ **පරිගණක අක්ෂර හා සැලසුම**
කේ. ඒ. සම්පත් ප්‍රසංග

**කොළඹ දිස්ත්‍රික් ස.ණ.ස. සංගමය**
**220/1, හයිලෙවල් පාර, මහරගම.**
**දු.ක. 0112 851213, 0112 848801, 0114 301228**
sanasacolombo@gmail.lk



# රන් පදක්කම් ලබයි

කොළඹ දිස්ත්‍රික් සණස සංගමයේ අනුග්‍රහය ඇතිව පඩුවස්නුවරදි පවත්වනු ලැබූ සමස්ථ ලංකා සාහිත්‍ය තරඟාවලියේදි රචනා අංශයේ පළමුවන ස්ථානයට හිමි රන් පදක්කම සහ සහතික පත්‍රය ආර්.ඒ.ඩී. සිතුමිනි කෞශල්‍යා දැරිය විසින් හිමිකර ගන්නා ලදී. ඇය නැ. ඇරැව්වල අංක 2 සණස ළමා සමාජයේ අංක සී. 184 දරණ සාමාජිකාවයි. ඇයට සුභ පැතුම්

**යු.ඩී.එස්. වීරසිංහ - වාර්තාකරු**

# 'ඔබ ඔබටම වැඩි මනාපය දෙන්න'



ඔබ වඩාත්ම කැමති කාටද? ඔබේ බිරිදට, පුතාට, දුවට මේ වාගේ වැලක්ම ඔබ කියවාගෙන යාවි. එහෙත් මම ඔබෙන් අසන්නේ මෙයයි. මේ ලෝකේ වැඩියෙන්ම ආදරේ කාටද? එහෙම නැත්නම් මේ දිනවල ප්‍රචලිත වචනය 'මනාපය' කාටද? ඔබ ඔබටම වැඩිම මනාපය දෙන්න. මේ අදහස මුලින්ම දේශනා කලේ අප තිලෝගුරු බුදුරජානන් වහන්සේය. තමන්ටම පළමුකොට සෙත් පත්න. අනිකුත් අයට පසු පිළිවෙලින් ආශිර්වාද කරන්න. ඔබ නිදුක්වෙත්වා... නිරෝගි වෙත්වා.... සුවපත් වෙත්වා...මේ වදන් කොයි තරම් සිතට සහනයක් ගෙන එන වචනද? ඔබට යම්කිසි කරුනකදී සිතට කේන්තියක් ආ විට හිතන්න මේ වචන පෙල අප කාටත් උත්තරීතර භාවයකට පත් නොවුන නිසා, තරහයාම, කේන්ති යාම ඇතිවෙනවා. එයින් අපේ ශරීරයට නොයෙකුත් අහිතකර බලපෑම් ඇතිවනවා. විශේෂයෙන් අධික රුධිර පීඩනය ඉහළ යාම එක් ප්‍රතිඵලයකි. එයින් තවත් අතුරු ප්‍රතිඵල ඇතිවන බව ඔබ දන්නවා.

ඒ නිසා අපි පළමු කොටම 'මම' ගැන හිතමු. මේ ලෝකයේ සියළු වස්තුවලට වඩා 'මම' ශ්‍රේෂ්ඨයි කියා හිතන්න. මම හොදින් හැදුනොත් මට හොදයි. මම එසේ නොවුනහොත් මට නරකයි. හැමදෙනාම මාව පසෙකලා මගහැර යාවි.

මගේ ශක්තිය මට විශාලයි. මට හැම දෙයක්ම කල හැකියි. එලෙස සැමවිටම ආත්ම විශ්වාසය මත ආත්ම අභිමානයෙන් කටයුතු කරන්න. ඔබ ජය ගන්නවා. ජය පැරදුම සොයන මේ කාලයේ පටන්ගත්න ඔබත් මේ ප්‍රතාපවත් තීරනයෙන්

**ලක්ෂ්මන් ගුණවර්ධන**
**පිටිපන නගරය සණස වාර්තාකරු**

# ලක්මව හඩයි

ඉන්ද්‍රිය සාගරේ බබලන මුතු ඇටය
පෙර කවිවරුන් මා හට නම දුන් සැටිය
අද රට හැරී ඇත්තේ නම් කණ පිටය
දෙස් පාලුවන් මේ වට වගකිව යුතුය

පෙර රජවරුන් රටතුල මහ වැව් බැන්දා
ගොවිතැන් නගා රට පොහොසත් කල හින්දා
සතුටෙන් සැපෙන් වැසියා ආයුෂ වින්දා
අද නැති කළා ඒ සේරම වස කැන්දා

නැත පළතුරක් දෙන්නට පොඩි දරුවන්ට
හදුනා නොගත් රෝගෙන් වෙයි මියයන්ට
මුදලට වහල්වී වසවිස යොදන්නට
මිනිසත් බව නැද්ද දෙවියනි වෙළදුන්ට

සෝමාවතියෙ මහගස් දැන් පෙර ලන්නේ
මුහුදු විහාරය ටික ටික වන සන්නේ
කවුරුද දෙවියනේ මේ වට අණ දෙන්නේ
ඇස් ගෙඩිවලට හෙණ වැදිලද මහවුන්නේ

තරුණ දරුවෝ මත් රකුසට බිලිවෙනවා
වේදිකාවේ මුන් බලයට පොර කනවා
ජාතිය දහම වනසන්නට වලිකනවා
මතු පරපුරට 'දෙවියනි' වේවිද මොනවා

**කේ.ඩී. සෝමලතා**
**503ඒ මුල්ලේරියාව දකුණ සණස**

# මගේ ගම සුරපුරකි

කන්කලු නදින් පැතිරෙන ගී මිහිර විද
පන්සිලු පවා නෙත් මානන දුරක හිද
තුන්සිලු දෙවන මංගල ගී තනුව මැද
දැන්මුලු ගමම ඇත හෙළයේ අසිරි විද

ගණදුර සිදී දැල්වෙන නෙක පහන් සිලු
පැහැබර අනාගතයක් ගොඩ නගන වලු
සණසින් කෙරෙන සේවය මගෙ ගමට මුලු
පින්බර දසුන කිය මගේ ගම නයන කලු

වනමල් සුවඳ විහිදෙයි ගම් දනව්වේ
දෙකපුල් රිදෙන තුරු මඳහස පිනෙව්වේ
කඩුපුල් පිපෙයි දෙව්ලොව සිරි දනව්වේ
කැළණිය, ගඟයි මගෙ කවි හඳ දිනෙව්වේ

කැළණිය කොමළ පිලිරුව් දෙන රසයේම
පියකරු දසුන කිය මගෙ ගමතුල බෝම
කලළුලි බසින විට නිතිගම් පියසේම
සළුපිලි වලද ගැම්බව සුරැකුනි බෝම

ජල සම්පතක් ගමතුල ඉදි කරන විට
වනමල් පිපී ගම සුසුවද දැනෙ විට
මහා බොල් පොලවේ තුරුලිය පල ගන්න විට
සතුටින් පසුවේවි ගම්වැසි සියළු විට

සුන්දර උදැසන සුදු පිරිවටය ඇද
ගින්දර නිවන්නට සසරේ බැදුන හඳ
පින්බර සිතුම් සිල් සුවඳින් පාන නෙද
ගම සුරපුරකි සීතාවක් පුරය මැද

**ලීලා බුලත්ගම**
**කහටපිටිය සණස සමිතිය**

# ධර්ම දේශණය හා දානමය පිංකම





පිටිපන නගර සණස සමිතිය සහ අනෙකුත් ප්‍රජා සංවිධානවල දායකත්වයෙන් සංවිධානය කල දම් දෙසුමක් සහ දානමය පිංකමක් පසුගියදා සමිති පරිශ්‍රයේදී පැවැත්වින.

**ලක්ෂ්මන් ගුණවර්ධන - පිටිපන නගර වාර්තාකරු**

# ශ්‍රී ලංකාවේ කාන්තා අයිතිවාසිකම් සුරක්ෂිතද ?

වර්ෂ 1909 දී නිව්යෝර්ක් නුවර රැස්වූ 3000 කට අධික කාන්තාවෝ ඡන්ද බලය ඉල්ලා උද්ඝෝෂනය කලෝය. ශ්‍රී ලාංකික ස්ත්‍රිය දේශපාලන බිමේ සෘජුව අයිතිවාසිකම් ඉල්ලා සටන් නොකලෝය. ඇය දේශපාලන බිමේ සටන් වදිනුයේ 1930 - 1950 කාල වකවානුව තුලදීය. වාමාංශික දේශපාලන කදවුරුවල නායකත්වය දැරූ කාන්තා නායිකාවෝ මැලේරියා මර්ධන ව්‍යාපාරය, ග්‍රාමීය සෞඛ්‍ය ව්‍යාපාරවල, මුල්තැන ගෙන ක්‍රියාකලහ. අප ඉතිහාසය පුරා වීර හෙළ කතුන් ගැන අසන්නට ලැබේ. විහාරමහා දේවිය, සෝමා දේවිය, අනුලා දේවිය ඊට උදාහරන වේ. මව්බිම බේරා ගැනීමේ සටන් වලදී පිරිමින් හා උරෙන් උර ගැටී සටන් බිමට ගිය කාන්තාවන් ගැන වාර්තාවේ. විදේශ ආක්‍රමණ හමුවේ කාන්තාවට පවුල් සංස්ථාවේ සුරකෂිත භාවය පිළිබද බරපතල ප්‍රශ්න ඇතිවිය. ඌව වෙල්ලස්ස කැරැල්ලේදී සුද්දෝ ගොවිබිම් ගිනි තැබූහ. දරු පවුල් පිටින් සමුල ඝාතනය කලහ. ස්වාමියා හරි හම්බ කලදෙය අරපිරිමසා ගනිමින් පවුල පෝෂණය කල කාන්තාවෝ අසරණභාවයට පත්වූහ. වතුවගා සදහා දකුණු ඉන්දීය ද්‍රවිඩයන් පවුල් පිටින් පදිංචි කරවීමෙන් ලාංකික සමාජයට ප්‍රශ්න උද්ගතවිය. පවුලේ අගහිඟකම් පිරිමසා ගැනිමට කාන්තාව විවිධ ගෘහ කර්මාන්ත වලට යොමුවිය. මැටි කර්මාන්තය, ලාක්ෂා කර්මාන්තය, වේවැල් වැඩ, පන් පැදුරු නිෂ්පදන, කෘෂි භාණ්ඩ නිෂ්පදනය හා අලෙවියේ යෙදුනි. පසු කාලිකව පෞද්ගලික හා රාජ්‍ය අංශයේද රැකියාවල නියුක්ත විය. සංචාරක කර්මාන්තයේ, විශේෂයෙන් භාවිතයන් සදහා නිම් භාණ්ඩ අලෙවි කිරිමට සමුපකාර ණයදෙන සමිති පවා පිහිටුවා ගන්නා ලදී. කොළඹ කොටුවේ පදික වේදිකා සහ සංචාරක හෝටල් අසල ඔවුන්ගේ ව්‍යාපාර ව්‍යාප්ත විය.



රටේ ජනගහනයෙන් 52% කට වැඩි පිරිසක් කාන්තාවන්ය. ශ්‍රම හමුදාව සහ අධ්‍යාපන ක්ෂේත්‍රයේ බහුතරයක් කාන්තාවන්ය. ශ්‍රම හමුදාව සහ අධ්‍යාපන ක්ෂේත්‍රයේ බහුතරයක් කාන්තාවන්ය. එහෙත් දේශපාලනයේ කාන්තාවන්ට ප්‍රමුඛත්වයක් නොලැබින. ලෝකයේ පලමුවන අගමැතිණිය 1960 දී පත්විය මෙවර ජනාධිපතිවරණය සදහා ඉදිරිපත් වුයේ කාන්තාවන් එක්කෙනෙකි. එහෙත් පිරිමි 34ක් ඒ සදහා නාමයෝජනා දී තිබුණි. පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය 5% කි. මන්ත්‍රීනියන් 12 කි. ඉන්දියාවේ 10.9%, නේපාලයේ 33% ක් ද වේ. රටවල් 190 සැසදීමේදී 180 වන ස්ථානය හිමිවේ. 2016 අංක 1 පළාත් පාලන මැතිවරණය සංශෝධන පනත මගින් කාන්තා නියෝජනයට 25% ක කෝටාවක් වෙන් කරන ලදී. ප්‍රායෝගිකව එය සාර්ථක නොවිනි. කාන්තාවකට මැතිවරණයට ඉදිරිපත් වීම දුෂ්කර කාර්යයකි. විශාල මුදල් වැය කිරීමක් පමණක් නොව විවිධ වධ බන්ධනයන්ට යොමුවීමට සිදුවේ. සමහරක් පිරිමි, කාන්තාවනට නායකත්වය දීමට අකමැතිය. නීති විෂයය පිළිබද උපරිම සුදුසුකම් සපුරා සිටි හිටපු අගවිනිසුරුවරිය ඉවත් කිරිමට යෙදූ දෝෂාභියෝගයේදී කටයුතු කළ ආකාරය ඉතා කනගාටුදායකය. 1977 න් පසු ඇතිවූ මැද පෙරදිග ගෘහ සේවයට කාන්තාවන් යැවීම, ඇඟලුම් කර්මාන්ත ව්‍යාප්ත කිරීම තුලින් කාන්තාවන්ගේ ආර්ථික ශක්තිය වර්ධනය විය. රටේ ප්‍රධාන විනිමය ඉපයීම කාන්තාවන්ගේ ශ්‍රම සැපයුම අනුව තීරණය විය. තරුණියෝ ගමෙන් නගරයට සංක්‍රමනයවීම තුල විවිධ සමාජ ප්‍රශ්ණ උද්ගත වූහ. මව්වරුන් විදේශ ගතවීමෙන් දරුවන්ගේ ආරක්ෂාව ආදරය පිළිබද ගැටලු මෙන්ම පවුල් සංස්ථාවේ බිඳ වැටීම් සිදුවිය.

ජනමාධ්‍ය හරහා කාන්තාව වාණිජ භාණ්ඩයක් බවට පත්කර තිබීම කණගාටුදායකය. සතිඅන්ත පුවත් පමණක් නොව විද්‍යුත් මාධ්‍ය හරහාද සිදුවන්නේ එයයි. උදාහරණ ලෙස (සම්භාහන) ස්පා/තෙරපිවරියන් සදහා වයස 17 සිට 30 දක්වා නොමිලයේ සියලු පහසුකම් සමග දිනක අවමය රු 5,000/- ගෙවන බව සදහන් කරයි. මේවා බොහොමයක් අපචාර කටයුතු සිදුවන ස්ථාන වෙයි. කිසිදු ප්‍රමිතියක් හෝ වගකීමකින් තොරව වෙළඳ දැන්වීම් ප්‍රකාශ කළ හැක. සංචාරක ව්‍යාපාරය තුලද විශේෂයෙන් ළමා අපචාර සිදුවේ. නඩු ලිපිගොනු 18,500ක් ඉතිරිව ඇතිබව අධිකරණ ඇමති ප්‍රකාශ කරයි. ගැහැණු ළමුන් මෙන් දෙගුණයක් පිරිමි ළමුන් අපචාරවලට ගොදුරුවී තිබේ. බාල වයස්කාර කාන්තාවන්ගේ නඩු සම්බන්ධ අධිකරණ තීන්දු ප්‍රකාශ වනවිට බොහෝ කාලයක් ගතවන නිසා විවිධ දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුවීමද කාන්තාවන් වීම නිසාම ලබන පීඩාවකි. කාන්තාව ස්වකීය අයිතිවාසිකම් දිනාගැනීමට සටන්කිරීමට ඉදිරියට නොආවද, රාජ්‍ය පාලකයින් කාන්තා ගැටලු පිළිබඳ සොයා බලා ඒවා ආරක්ෂා කරදීමට කටයුතු කළ යුතුය. වනිතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයක් පැවතියද කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කරදීමේ රාජ්‍ය මැදිහත්වීම ඉතා දුර්වල බව කිවයුතුය.

**යු.ඩී.එස්. වීරසිංහ**
**නැ. ඇරැව්වල අංක 2**
**සණස සමිතිය**

# බිඳුනු සිහින

සුළං හමනවා - තුරු පෙරලෙනවා
ඵල විසිවෙනවා - අපොයි කියනවා
වැස්ස වහිනවා - අකුණු කොටනවා
ගිණි විසිවෙනවා - මැරී වැටෙනවා
පරිසරය අඩනවා - දිය බොර වෙනවා
මෝය කැඩෙනවා - ඉවුරු බිදෙනවා
බිළිඳු හඬනවා - කිරිත් එරෙනවා
දෙතොල් නටනවා - රස තිත්වෙනවා
දරුව වැඩෙනවා - ගත සිත දැඩිවෙනවා
අමතක වෙනවා - පියෙකු කොහිද අහනවා
දහම් කරුණු මැකෙනවා - අසරණ වෙනවා
ගණුදෙනුව කෙරෙනවා - තනි තනිව බුදුනවා
කාලය යනවා - පියතුම තනිවෙනවා
මැසිවිලිද නැගෙනවා - විමසුම්ද කෙරෙනවා
මව් - පිය ද තැවෙනවා - නිවස අදුරේ යනවා
ගොම රිටිද වැටෙනවා - කිරි කලය බිදෙනවා
සිහි එළඹ ගන්නවා - අපි අනාථ වෙනවා

**හේමසිරි බෙනරගම**

# මොක් සුව ලබමු



දස මසක් මව් කුසේ ඉඳලා
එළිය දුටුවා මේ භවේ.....
ඉපදිලා වැඩි කලක් නොගොසින්
වැටහුනා තතු මේ ලොවේ....
මෙසංසාරේ පව් ගෙවන්නට
ඉපදෙන්නෙ ඇයි සැම භවේ......
මේ භවෙන් පසු නොඉපදෙන්නට
පතමු අප සැම නිවන් සුවේ.....

ඉපදී ඉපදී මැරෙනවා මිස
කුමක්දෝ අපි රැස්කලේ.....
සැම දිනකම පවක් මිස නැහැ
පිනක් කිසිදා රැස්කලේ....
බුදුන් කෙනෙකුන් උපන්නොත් යලි
ලබන්නට හැක පින් බලේ.....
එපින් බලයෙන් අපට හැකිවෙයි
ලබා ගන්නට මොක්සුවේ.....

**ජයනි ශිරෝමා පීරිස් - එගොඩඋයන සණස**

# දකුණු රත්මලාන සණස සමිතියේ
## ප්‍රජා සේවා ඇගයීමක්





දකුණු රත්මලාන සණස සමිතිය මගින් කරන්නාවු සමාජ මෙහෙවරයන් අතරට මෙවර 2019 වසර සඳහා ප්‍රදේශයේ සමාජ සේවකයින්, ජනහිතකාමීන් දීර්ඝ කාලයක් සමාජයට නිශ්ශබ්දව කරන ලද සේවය ඇගයීමට ලක්කරනු වස් 'ජන ප්‍රසාදනී ප්‍රණාම' නමින් උත්සවයක් සංවිධානය කරන ලදී. මේ සඳහා ප්‍රදේශය තුල නිහඬ මෙහෙවරක යෙදුනු ඒ.ඒ.එන්. මයුරතිස්ස මාතාව, සුනීත චන්ද්‍රපාල් වඩුගේ පියාණන් හා ඩී.කේ.ඒ. ප්‍රියදර්ශන මහතා යන තිදෙනාව ඇගයීමට ලක් කරන ලදී.

**කළමනාකරු - ද/රත්මලාන සණස**

# මව සිහිකරමින්

පියා සමග අප තනි කර දමා ගොසින්
දිනසති ගෙවුනි ඔබ නැති කල සිතේ දුකින්
ඔබෙ රුව මැවෙන විට හදවත දැවී ගොසින්
පාළුව කාන්සිය අපෙ හිත තුරුළු කරන්

අපි දන්නවා කොහේ සිටියත් ඔබ අම්මේ
අප දෙස බලා සිටිනවා ආදර අම්මේ
සෑම විටම පිං පෙත් දෙමි අපෙ අම්මේ
උපදින සෑම භවයෙම එක්වෙමු අම්මේ

ඔබ සිහිකරන්නේ කඳුලැල් පිරුණු නෙතින්
බැහැ ඉවසන්න අම්මේ ඔබ නොමැති සොවින්
දුක ශෝකය දරා සිටිනෙමි පිය කඳුළු ඇසින්
අම්මේ ඔබට පතනවා හිමිවෙන්න නිවන්

**ඩී.එන්. ජයසිංහ - ගලවිල මාලපල්ල සණස**

# සාමවිනිසුරු පදවිය ලබයි



සීතාපුර සණස සමිතියේ ගරු සභාපතිනී පියසීලි හේමලතා මහත්මිය පසුගියදා අවිස්සාවේල්ල මහේස්ත්‍රාත් අධිකරණයේදී දිවයිනටම සාම විනිසුරුවරියක ලෙස දිවුරුම් දුන්නාය.

කෑගල්ල ගුරුගල්ල කනිෂ්ඨ විද්‍යාලයෙන් හා රුවන්වැල්ල රාජසිංහ මධ්‍ය විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා රත්නපුර කාර්මික විද්‍යාලයේ හා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලයෙන් උසස් අධ්‍යාපනය ලැබූ ඇය. වසර ගණනාවක් දහම් පාසල් ගුරුවරියක ලෙසද කටයුතු කර ඇත. ඇයට අප සමිතියේ සියලුම සාමාජික සාමාජිකාවන්ගේ සුභ පැතුම් පිරිනමමු.

**ගීතානි ප්‍රියදර්ශනී - ලේකම්**

# දෙදින චාරිකාව



සීමාසහිත කළුබෝවිල සණස සමිතියේ වාර්ෂික සංවිධානය කරනු ලබන විනෝද හා වන්දනා චාරිකාව පසුගිය දා දෙදිනක් පුරා සිදුකරන ලදී. අනුරාධපුරයේ ශ්‍රී මහා බෝධින් වහන්සේ රුවන්වැලි මහා සෑය, අටමස්ථානය, පොලොන්නරුව නව කෞතුකාගාරය ගල්විහාරය වටදා ගෙය, හැටදා ගෙය, ශිව දේවාලය රංකොත් වෙහෙර ආදී පූජනීය ස්ථාන නැරඹීමට සණස සමිතියේ සාමාජික සාමාජිකාවන් හා ඔවුන්ගේ පවුල්වල දු දරුවන් ඇතුළුව 54 දෙනෙක් පමන පිරිසක් මෙයට සහභාගි විය.

**සෝමා පීරිස් කළුබෝවිල සණස**

# සිතට දැනුන අදහසක්

නරක මිනිසුන් නිසා සැම විටම
හොඳ මිනිස්සු දුක් විඳිති....
තාඩන පීඩා වලට ගොදුරු වෙති....
හොඳ මිනිසුන්ට වඩා
නරක මිනිස්සු දක්ෂවෙති,
ඔවුන් ඉක්මනින් දියුණු වෙති.
එහෙත් අවසානයේ නොසිතූ දෙයකින්
සියල්ල විනාශවෙති.
නරක මිනිස්සු පරදිති...
හොඳ මිනිස්සු ජය ගනිති.
ඉර නැගෙනහිරින් පායා බස්නාහිරින්
බැසයාම අසත්‍ය මායාවකි,
බුද්ධියේ ඇසින් බැලුකල...
ඉර එක තැනක තිබියදී
ලෝකය ඒ වටා කැරකීම සත්‍යයකි.

**ලීලා බුලත්ගම**
**කහටපිටිය සණස සමිතිය**

# ආදරණීය
## තාත්තා වෙනුවෙනි

සිව් වසරක් ගතවුනි නුඹ මලගම් ගියදා
මා තවමත් මෙලොව කැරකෙමි පව් කල හංදා
රෑ නිදි මරා අපහට ජීවය දුන්දා
තාමත් අඬනවා ඇස් ඔබ සිහි ගන්වනදා

ගහේ පොත්ත මෙන් සිටියේ මලනු හා බැඳී
නුඹ නැති මේ ටිකට ඒ ගස බිමට වැදී
සිවු වසරක් උනා ඒ දර ලිපට ඇදී
මොනවා කලත් නුඹ මගෙ මතකයට වදී

නුඹ සුර ලොවෙහි බව සිහිනෙන් පෙනෙන්නේ
පිං කර මමත් කවදා හෝ එහි එන්නේ
ඔවදන් දෙන්න මා හට කිසිවකු නෑනේ
දුන් ඔවදන් තුලින් ජීවිතෙ ගෙනි යනවානේ

**සන්ධ්‍යා ජයකොඩි**
**පිටිපන නගරය සණස**

# වාර්ෂික චාරිකාව






පානලුව සණස සමිතිය මගින් සංවිධානය කරන වාර්ෂික චාරිකව මෙවරත් මහියංගනය දළදා මාලිගාව, ආදිවාසී ගම්මානය, මුතියංගනය දුන්හිඳ රාවනා ඇල්ල නැරඹුවේ ඉතා සතුටිනි. ඉන්පසු හපුතලය හුළං කපොල්ල ලඟ (පුංචි ලෝකාන්තය) පැදුරු සාජ්ජයක් පවත්වා විනෝද වීමට සාමාජිකයන්ට ඉඩ සැලසුවෙමු. සියලුම සාමාජික මහත්ම මහත්මියන් ඉතා සතුටින් විනෝද වූයේ මෙවර චාරිකාව සංවිධානය කල අධ්‍යක්ෂක මණ්ඩලයට ස්තූතිය පුද කරමින්ය.



**ප්‍රියානි පානලුව සණස ලේකම්**

# පැපිලියාන පිපෙන කැකුළු ළමා දන්සල



සී.ස. පැපිලියාන සණස සමිතියේ පිපෙන කැකුළු පුංචි දන්සල පසුගියදා පැවැත්වූ වගයි. කාන්තා කමිටු සභාපතිනි ලසින්තා මහත්මියගේ අදහස් අනුව බෙලි මල් දන්සල පවත්වන ලදී. මෙයට මූලික අරමුණ ළමුන් දන්දීමට පුරුදු කිරීමයි. සුනේත්‍රාදේවි රජමහා විහාරයේ දි දන්සල් සිදු කරන ලදී. සුමනධම්ම ස්වාමීන් වහන්සේගේ හා සභාපති සුජිත් කුමාර මහතාගේ සහයෝගයෙන්ද, සණස කාන්තා කමිටුවේ සාමාජිකාවන්ගේ සහයෝගයෙන් ඇතුලු දරුවන්ගේ දෙමාපියන්ගේ සහයෝගය ඇතිව බෙලිමල් දන්සල සාර්ථකව සිදු කරන ලදී.

**එච්.එම්. සසිකා ගයනි පෙරේරා - පැපිලියාන සණස**

## ජාතික ළමා සාහිත්‍ය උළෙල 2019





චිත්‍ර තරඟයෙන් ලංකාවේ 3 වන ස්ථානය ලබාගත් සී.ර. වග-නැගෙනහිර සණස සමිතියට අනුබද්ධ රන්දරු ළමා සමාජයේ පී.ඩී. සුධීර දීමන්ත සිසුවට හා

චිත්‍ර තරඟයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ 3 වන ස්ථානය ලබාගත් පී.ඩී. උදාන්ත දම්රුවන් සිසුවාටද

රචනා තරඟයෙන් කොළඹ දිස්ත්‍රික්කයෙන් 3 වන ස්ථානය ලබාගත් ජී. මල්මි සදීශා සිසුවියටද

සමිතියේ නිළධාරී මණ්ඩලය කාර්‍ය මන්ඩලය හා සාමාජික සාමාජිකාවන්ගේ උනුසුම් සුභ පැතුම්

**කළමණාකරු වග නැගෙනහිර**

# කාලගුණය, ගුණවත්ද?

මේ දින වල පවතින කාලගුණික තත්වය පිළිබඳව වරින් වර, මාධ්‍යයන් මගින් ජනතාව දැනුවත් කරන්නේ ජීවිතයක ඇති වටිනාකම මිලකල නොහැකි බැවිනි. එහෙත් සමාජගත මිනිසා මෙම කාලගුණික වාර්තා ගැන සැලකිල්ලක් දක්වන්නේද යන්න ප්‍රශ්ණයකි. මන්ද මුහුදු ගමනේ යෙදෙන මසුන් මරන්නන් කොතෙකුත් පීඩාවට හා අවසානවන්ත ඉරණමට ගොදුරුව ඇත්ද? ගොඩබිම වසන හැම සත්වයෙකුටම අකුණු සැර වැදීමට ඇති අවස්ථා සේව ගං වතුර ගලා ගම්බිම් හා නිවාස දේපොල විනාශ වී ඇති අවස්ථාද, අපි අසා ඇත්තෙමු.

එසේම විදුලි සැර වැදී මරණයට පත් වූවන් කොතෙක්ද? අවාසනාවන්ත මෙවන් සිදුවීම් නිසා සමාජයට විධිමත් දැනුවත් භාවයක් ලබා ගැනීමට ඇති අවස්ථා බොහෝ විට ඕනෑකමින්ම මගහරවා ගෙන ඇත. කාලගුණය ගැන දත්තයන් දක්වන එම දෙපාර්තමේන්තුවේ වගකීම එසේ සිදු වෙද්දී, නවීන තාක්‍ෂණ ක්‍රමවේද අනුගමනය කරන්නට පහසුකම් නොසැපයෙන්නේ කුමණ හේතුවක් නිසාද යන්න ප්‍රශ්ණයකි.

ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25න් විවිධ කාලගුණික තත්ත්වයන් එකම දිනක එකම වේලාවක දැකිය හැකි වීම විශේෂයකි. එසේම උතුරේ සිට දකුණට ගමන් කිරීමේදී, කාලගුණය වෙනස්වීමෙන් මිනිසුන්ට ලැබෙන අත්දැකීම්ද බොහෝය. යාපනයේ සේරුවාවිල වන්දනාවට ගිය නඩයක මුහුදු ගමනේදී කුණාටුවට හසුවී විපතක් සිදුවන විට, මධ්‍යම පළාතේ අනුරාධපුර උග්‍රලෙස දාහය ඇති කරමින් හිරු රැස් වැටේ. එසේම මාතරට එන විට ගංවතුර ගලා ඇති වී ඇති දේපොල විනාශය අතිමහත්ය. මෙසේ කාලගුණය අපේ සුන්දර සිරිලකට ලබා දෙන අධ්‍යාපනික පාඩම අපූරුය.

පෘථිවිය තම කක්ෂය වටා ගමන් කරන අතර හිරු වටාද භ්‍රමණය වේ. එවිට හිරු වටා යන පෘථිවියේ අඩකට දහවල් කාලය පැය දොළහක්ද රාත්‍රී කාලය පැය දොලහක්ද වේ. මෙම චක්‍රය දින 365ක් වසර පුරා නොකඩවා ක්‍රියාත්මක වේ. අධික අවුරුද්දක් වුවොත් එය දින 366ක් වනු ඇත. පෙබරවාරි මාසය වසර හතරකට වරක් එසේ දිනක වෙනස සිදුකරනු ලබයි.

සමුපකාරික දරුවන්ට මේ දිනවල පවතින කාලගුණික තත්ත්වයන් පිළිබද අධ්‍යයනය කරන්නට ඉතා සුදුසුම කාලයයි. වින්දනීය අභ්‍යවකාශය ගවේෂණයට ළමා ඔබට ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය උදව් කරනු ඇත.

**(පොත පත ඇසුරෙන්)**
**හේමසිරි බෙනරගම**

## මාසික තිළිණය

ස.ණ.ස. කොළඹ පුවත් මාසික ප්‍රශ්ණයට කූපනය මගින් ඔබ සපයන, නිවැරදි පිළිතුරට තිළිණයක් පිරිනැමීමට කටයුතු සම්පාදනය කර ඇති බව සතුටින් දන්වමු.

ඔබ ජයග්‍රහකයෙක් නම්, ඔබේ සමිතියේ හා පෞද්ගලික අනන්‍යතාවය තහවුරු කරවා එම තිළිණය දිසා සංගමයෙන් ලබාගන්න.

**සංස්කාරක මණ්ඩලය**

## කියවන්න... දැනුම ලබන්න....

### දෝතට තෑගි ගන්න ....

ඔබ කළ යුත්තේ මෙහි පළවන ප්‍රශ්ණයට පිළිතුර කූපනයේ පුරවා තැපැල් පතක අලවා සණස පුවත් කොළඹින් අංක 220/1, හයිලෙවල් පාර, වත්තේගෙදර, මහරගම වෙත 2019 දෙසැම්බර් 15 ට පෙර එවීමයි. ජයග්‍රාහකයින් රැසක් සිටියහොත් කුසපත් ඇදීමෙන් වාසනාවන්තයා තෝරා ගනු ලැබේ.

**ප්‍රශ්ණය :-** **ශ්‍රී ලංකාවේ පළමු අගමැතිණිය ලෙස පත් වු කාන්තාව කිනම් වර්ෂයක පත්වීද?**

## කූපන් තරගයේ ජයග්‍රහණය

**කූපන අංක 09**

**සී.ස. රාජගිරිය නැගෙනහිර සණස සමිතියේ**
**ජී.එච්.එන්.ජේ. පෙරේරා**

## කූපන් අංකය 11

මුලකුරු සමග නම: ...........................................................
ස්ථිර ලිපිනය: ...........................................................
...........................................................
දුරකථන අංකය: ...........................................................
පුරුදු අත්සන: ...........................................................
සණස සමිතියේ නම: ...........................................................
...........................................................
පිළිතුර: ...........................................................
...........................................................

# සුභ උපන්දිනයක් වේවා !!



සී.ස. පැපිලියාන සණස සමිතියේ සැප්තැම්බර් මස උපන්දින සැමරුවන්

### කරගම්පිටිය සමිතියේ පසුගිය මස උපන් දිනය සැමරූ අය



ටී.කේ. සුවාරිස් | නීතා රබෙල් | එන්. පෙරේරා | එච්. ප්‍රනාන්දු | ඒ. විතානගේ | ජේ. චන්ද්‍රසේකර | එම්. ඉන්ද්‍රානි



ජී. ප්‍රනාන්දු | ජී. ද සොයිසා | එස්. ප්‍රනාන්දු | පී. ඉන්ද්‍රලතා | පී. කුමුදුනි | මාලති මල්ලිකා | පී. රංජනී



ඩී. බණ්ඩාරගේ | ආර්. පෙරේරා | එන්. දිල්රුක්ෂි | ආර්.එම්. කුමාරි | පී. ජයලත් | රාණි අයිරිස් | එස්.එච්. දයාවති | අයි. විරංග | ඒ. ප්‍රනාන්දු | නිලූ රීටා | වී. පීරිස් | පී. මෙන්ඩිස්

## වසර මැද ප්‍රතිලාභ



නැදිමාල සණස සමිතියේ සාමාජික,සාමාජිකාවන්ට වසර මැද ප්‍රතිලාභ වශයෙන් රුපියල් ලක්ෂ හතකට අධික වටිනාකමකින් යුක්ත තෑගි වවුචර් ලබාදුන් වගයි.

**චාන්දනි පුෂ්පකුමාරි - වාර්තාකාරිනී**



**ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරීවරයෙකු**
**මෙන්ම**
**භාණ්ඩාගාරයේ මුදල් අධ්‍යක්ෂවරයකු වූ**

## සංගමයේ සභාපතිගෙන්

### ප්‍රශ්න විමසා පිළිතුරු ලබා ගන්න.

**ප්‍රශ්ණය** : සමිතියේ මුදල් වර්ෂය නිමවී මාස 3 ක්තුළ විගණනය සඳහා ගිණුම් ඉදිරිපත් නොකිරීම නිසා කාරක සභාවට එරෙහිව කුමන නීතිමය ක්‍රියාවන් ගත හැකි ද?

**පිළිතුර** : මෙම නියමයේ අරමුණ වන්නේ සෑම සමිතියක්ම වාර්ෂිකවම අවසාන ගිණුම සකස් කිරීමේ අවශ්‍යතාවයයි. මෙම නියමය අනුව නිසි කලට ගිණුම් විගණනය ඉදිරිපත් නොකළ හොත් ප්‍රඥප්තියේ 43(ආ (5) වගන්තියේ දැක්වෙන්නේ කාරක සභිකයින් සියලු දෙනාම වරදකට වරදකරු වන බවයි. මහේස්ත්‍රාත් වරයෙකු ඉදිරියේ පවත්වන ලඝු නඩු විභාගයකින් පසු වරදකරුවන් වුවහොත් රුපියල් දෙදහසකට නොවැඩිවන දඩයකයට යටත් කළ හැකි බවයි. එහි (6) වගන්තියෙන් දක්වන්නේ එම වරද කලේ තමාගේ අනුදැනුම නැතිව බව හා වරද වළක්වා ගැනීමට උත්සාහයන් දරා ඇති බව ඔප්පු කළ හොත් එම වරදට වරදකරු නොවන බවය.

මෙසේ ගිණුම් ඉදිරිපත් කිරීමේ නියමය ඇත්තේ ප්‍රඥප්තියේ 44 වගන්තියෙන් කියවෙන පරිදි සෑම සමිතියකම ගිණුම් අවුරුද්දකට වරක් රෙජිස්ට්‍රාර් විසින් කරවිය යුතු බවට වූ නියමය නිසාය. මෙහි අරමුණ වන්නේ වසරක් පාසාම සෑම සමිතියකම ගිණුම් විගණනය කිරීමේ වගකීම රිජිස්ට්‍රාර්වරයා විසින් ඉටු කළ යුතුවීමය. මේ නියමයන් හරියාකාරව ක්‍රියාත්මක වන්නේනම් එහි ප්‍රථිපලය වන්නේ සෑම සමිතියකම ගිණුම් වාර්ෂිකවම විගණනය නිමවිය යුතු බවයි.

**ප්‍රශ්ණය** : ගිණුම් නිසි දිනට නොයැවීම නිසා රු. 2000/- ට නොවැඩි දඩයක් ගෙවීමෙන් සමිතියේ ගිණුම් විගණනය වන්නේ ද?

**පිළිතුර** : වැදගත්ම කාරණය එයයි. ප්‍රධාන අවශ්‍යතාවය දඩුවම නොවේ. ගිණුම් පිළියෙළ කිරීම හා විගණනයයි. ඒ සඳහා රීති අංක 40 අනුව, රිජිස්ට්‍රාර්වරයාට දී ඇති බලය වන්නේ, ගිණුම් හෝ පොත්පත් ලිවීමට තමන් බලය පවරන ඕනෑම අයෙකු ලවා කරවා ගැනීමටත්, ඔහුට ගෙවිය යුතු ගාස්තු තීරණය කිරීමටත්, ඒ මුදල සමිතියට ගෙවීමට අණ කිරීමටත් ය. එම අණ පරිදි නොගෙවා සිටියහොත් එයද මහේස්ත්‍රාත් අධිකරණය මගින් දඩමුදලක් සේ අයකිරීමට නියමවී ඇත. මේ නිසා මෙම නියමයන් අනුව කිසි විටෙකත් ගිණුම් විගණනය වාර්ෂිකව සිදු නොකර, එහි වරද සමිති වෙත පවරා සිටීමට රිජිස්ට්‍රාර් වරයාට ඉඩක් නැත. මේ වගන්තිවල නියමයන් නිසිලෙස මෑත දශක ගණනාවක සිටම සිදු නොකිරීමෙන් සිය වගකීම් ඉටු නොකිරීම නිසා සමිතිවල කටයුතු නිසි ලෙස සිදුවී නැති බව මෙන්ම අක්‍රමිකතාවන්ට පත්වීමේ එක් ප්‍රධාන සාධකයක් බව අප අකමැත්තෙන් වුව ද පිළි ගත යුතුය.

මෙසේ පවසා රිජිස්ට්‍රාර්වරයා විසින් විගණනය කළ යුතු බවට නීතිමය වශයෙන් තර්ක කළ හැකි වුවත්, සියලු සමිති වල නාකයයින් හා කළමනාකරුවන්ගේ වගකීම විය යුත්තේ විගණනයකින් බලාපොරොත්තුවන නිවැරදි බව අවශ්‍යවන්නේ කවරකුට ද යන්නය. එය අවශ්‍යවන්නේ සමිතියට නිසා විගණනය පමා වුවත්, අවසාන ගිණුම් සකස් කිරීම අතපසු නොකළ යුතු බවය. එසේම නිවැරදිව සියල්ල තිබිය යුතු බවට වග බලා ගැනීමය.

## සමුපකාරය, වර්තමානයට

ලොව විශ්ව ගම්මානයකි. වර්තමානයේ ගෝලීයකරණය එසේ හඳුන්වනු ලබයි. සියළුම කාර්යයන් එකසේම කළහැකි වීම විද්‍යුත් තාක්‍ෂණයේ උදව්වෙන් අද සිදුවෙමින් පවතී. ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටක්සේ, දසක කීපයක් ගෙවී යද්දී වුවද හඳුන්වන්නේ ඇයිද යන්න ඔබට ප්‍රශ්ණයක් වූ අවස්ථා ඇත.

ප්‍රාග්ධනය සියලු රටවල් අතර තමතමන්ගේ විවෘත වෙළඳපලවල් කරා යාම හා ආයෝජනය කලහැකි වීම රටවල් අතර ශ්‍රමිකයින් හුවමාරු කර ගැනීම, රටවල් අතර භාණ්ඩ හා සේවාවන් ලබාදෙමින්, ගෝලීයකරණයට නෑකම් කියයි. මේ නිසාම වෙළඳපොල විවෘතවීම නිරායාසයෙන් සිදුවන්නකි. එසේම තරඟකාරීද වේ.

මෙසේ තරඟකාරීත්වයට එළඹීමට නොහැකි වන රටවල් විසින් විවිධ බලපෑම් ඇති කිරීමෙන් ගෝලීයකරණයට සෘණ අදහසක් දෙමින් අසුභවාදීව පෙන්වා දීමට පෙළඹී ඇති බව අපි දනිමු. මේ නිසාම ජාත්‍යන්තර කම්කරු සංවිධානය මගින් නීති-රීති පනවා මෙම තත්වය මගහරවා ලීමට කටයුතු කර ඇත. සංවර්ධිත රටවල් නිරන්තරයෙන් උත්සාහ ගන්නේ ඔවුන්ගේ ආධිපත්‍යය රඳවා ගෙන පෙරට යාමය. දකුණු කොරියාව, තායිලන්තය හා සිංගප්පූරුව වැනි රටවල් තම ආර්ථික ජයග්‍රහණ ළඟා කර ගැනීමට ගෝලීකරණය උපයෝගී කරගෙන ඇත.

ශ්‍රී ලංකා ආර්ථිකයටද ගෝලීයකරණයේ බලපෑමක් සිදුකර ඇත. අප රටේ තිස් අවුරුදු යුද්ධය නිමාකර ගැනීමෙන් පසු කඩා වැටුනු ආර්ථිකය නැවත ඔසවා තබන්නට ගෝලීයකරණය උපයෝගී කරගත හැක. මේ සඳහා බහුජාතික සමාගම් හා තරඟ කරමින් ඉදිරි ගමනක යෙදීමට සමුපකාරය ශක්තිමත් කළ යුතුය. පැරණි විවිධ සේවා සමුපකාර ක්‍රම භාවිතයෙන් මිදී නවීන තාක්‍ෂණික ශිල්ප ක්‍රම සමුපකාරයට යොදා ගැනීමෙන් අපනයන වෙළඳපොලට අවතීර්ණ විය යුතුය. 2020 වසරට පිවිසෙන අපිට මෙවර පැවැත්වෙන් ජනාධිපති වරණයේදී ඒ සඳහා ඉදිරිපත්ව ඇති ප්‍රධාන පක්ෂ නියෝජනය කරන අපේක්ෂකයින් ගෙන් කීප දෙනෙක් මේ වන විටත් මැතිවරණ වේදිකාවන් තුලදී කරඇති ප්‍රකාශ මදක් සැනසීමට හේතුවක් වනු ඇත. අපනයන ප්‍රවේශ සමග දියුණු ව්‍යවසායකත්ව උපායමාර්ග යොදා ගැනීමෙන් සමුපකාර ක්‍රමවේදයන්ට පණදී නව ප්‍රවේශයක් ගත යුතුව ඇත.

ආර්ථික සංවර්ධන සඳහා සමුපකාරයේ දායකත්වය දළිදුකම පිටුදැකීමට, රැකියා අවස්ථා ඇතිකර ප්‍රවර්ධනය කිරීමට හා සමාජ ඒකාග්‍රතාවය ඇතිකිරීමෙන් විශේෂිත බලපෑම් කළහැකි බව, එක්සත් ජාතීන්ගේ මහා සම්මේලනය මීට වසර අටකට පෙර ගෙන්වා දෙමින් ජාත්‍යන්තර සමුපකාර වර්ෂය ලෙස 2012 හදුන්වා දී ඇත. සමුපකාරය ගොඩනැගීම හා තහවුරු කිරීමට ජාත්‍යන්තර වශයෙන් එකඟ වූ සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට, වෙන් වශයෙන් හෝ සංවිධාන වශයෙන් හෝ රජයක් ලෙසින් හෝ කිසියම් උනන්දුවක් ඇති කළ යුතුය.

සහශ්‍ර සංවර්ධන ඉලක්ක ලෙස පෙන්වා දී ඇත්තේ පහත සදහන් කරුණු වේ. 1. අන්ත දිළිඳුම සහ බඩගින්න නැති කිරීම. (2) විශ්වයටම ප්‍රථමික අධ්‍යාපනය ලබාදීම. (3) ස්ත්‍රී පුරුෂ සමාජභාවය වර්ධනය කිරීම හා කාන්තා බලගැන්වීම (4) ළමා මරණ අඩු කිරීම (5) මාතෘ සෞඛ්‍යය වර්ධනය කිරීම (6) බෝවන රෝග තුරන් කිරීම (7) පාරිසරික තිරසාරකත්වය තහවුරු කිරීම (8) සංවර්ධනය සදහා විශ්ව සහයෝගීතාවය වර්ධනය කිරීම.

ශ්‍රී ලංකාවේ සිට ජාත්‍යන්තර ප්‍රජාව දක්වා සමාජයේ සෑම ස්ථරයකම සමාජ ආර්ථික සංවර්ධනය සදහා සමුපකාරවලට කළ හැකි කාර්යයන් පෙන්වා දෙමින් ධෛර්යය සම්පන්න සමුපකාරිකයින්ගේ මනසට ධනාත්මක සිතිවිලි ඇතුල් කළ යුතුව ඇත.

සණස සාමාජික ඔබ සැමට අනාගතය විධිමත්ව නගා සිටුවිමට වගකීමක් ඇතිවාසේම ඊට වගවීමද සිදුකළ යුතු වන්නේය.

**හේමසිරි බෙනරගම**

### ජාතක කතා පොතෙන්
## පාදඤ්ජලී ජාතකය

| | |
|---|---|
| බඹදත් රජු පුරෝහිතව අප මහබෝසත් | එකලේ |
| බරණැස් පුර පාලනයට නිරතුරු උපදෙස් | වපුලේ |
| සුවහස් දන සම්මුතියට හිස නවමින් එක | එල්ලේ |
| අදහස් නැහැ විරෝධයට පාලනයේ | අරුණැල්ලේ |
| පාදඤ්ජලි පුත් කුමරුන් අනුවණකම් | කරමින්නේ |
| අවියත් කම් මතු කරමින් ජීවන ඔරුවේ | යන්නේ |
| පිය රජුගේ වියෝ දුකින් කල් මරමින | පසුවන්නේ |
| අබිසෙස් ලැබ රජ කෙරුමට ඔහු නැහැ යුහුසුළු | වන්නේ |
| ඇමති සැවොම ගත් තීරණ සිහසුන මත | හිඳුවන්නට |
| පාදඤ්ජලී කුමරු කෙරේ, විමසුම් පැන යොමු | වන්නට |
| විසදුම දෙයි නඩුව අසා, හිමි අහිමිව වරදක් | කොට |
| තීරණයේ දොසක් වෙත්ද, විමසයි කුමරුව | ලංකොට |
| වදනින් නොව ඉගිපාමින් තොල් පිටතට | නමාගෙනේ |
| කුමරු නිහඬ තීරණයයි, ඇමතින් හට තබා | පැනේ |
| තවත් පැනකි විමසන්නේ රජ කුමරුව මැන | ගන්නේ |
| නැණවත් පඩි බව යටවී, කුමරුගෙ තොල් | පෙරලෙන්නේ |
| ඇමති මඩුල්ලේ අවසන් තීරණයයි ගෙන | එන්නේ |
| පුරෝහිතව රජ කරවා සිහසුන මත හිඳු | වන්නේ |
| විකාර රූපී ඉඟි වල රජු අණසක නැහැ | දුන්නේ |
| දහම් අරුත් නොදැනීමෙන්, හිස් බව පෙන්නා | දුන්නේ |

*උපදේශය: නුවමනා කාය විකාර කරන්නන්ගේ ඇතුලත හිස්වේ.* -සිරි-

*මානව වර්ගයාගේ උපතේ සිට මරණය තෙක්, ජීවත්වීමේ හරය වන්නේ සමුපකාරයයි.*

01 පිටුවෙන්...

## සමුපකාරය අර්ථක්‍රමයකි. නිලබලය හා ධනබලය ඇත්තන්ට එය නොතේරේ.

වාර්තාව ("Sri Lanka Sessional Papers,2002- Report of The Presidential Commission of Inquiry on the Co-operative Movement of Sri Lanka") ලෙස ප්‍රකාශයට පත් කර ඇත. පරිච්ඡේද 13 කින් සමන්විත මෙම වාර්තාවේ නිර්දේශයන් හා එම වාර්තාව කියවා බලන්නේ නම් සමුපකාර ප්‍රවර්ධනය කිරීමෙන් රටක ඇති විය හැකි සංවර්ධනය මැනවින් වටහා ගත හැකිය. මේරටේ සමුපකාරය යනුවෙන් වැඩි දෙනා වටහා ගෙන සිටින්නේ විවිධසේවා සමුපකාර ගැන බව සදහන් කිරීම වඩාත් නිවැරදිය. එහෙත් එම සමුපකාරවලින් බහුතරයක්ම නමින් සමුපකාර මිස භාවිතයෙන් සමුපකාර නොවේ. සමුපකාරයක මූලිකවම භාවිතය විය යුත්තේ සාමාජිකයින් බල ගන්වන පරිදි ඔවුන්ගේ අදහස් ලබා ගෙන ඔවුන් ගේ සංවිධානයක් බවට ඒත්තු යන පරිදි ඔවුන් මූලික කරගත් සේවාවන් සලසා දීමය. ජීවන ගැටලු විසදා ගැනීම සදහා ජනතාව නිරතවන සෑම ක්ෂේත්‍රයකම සමුපකාර සංවිධාන පවතී. එසේ ලියාපදිංචි ඇති සමිති 15000 ක් පමණ වේ. සාමාජික පවුල් ප්‍රමාණය මිලියන 9 ක් පමණය. නිරත සේවක සංඛ්‍යාව 50000 කට ආසන්නය. මෙම සමිති අතරින් විවිධ සේවා සමුපකාර සමිති 300 ක් පමණ වේ. මෙම සමිති වලට අධ්‍යක්ෂ මණ්ඩල තේරීම දේශපාලන පක්ෂ ක්‍රියාකාරීන්ගේ බලපෑම මත සිදුවන නිසාම පක්ෂ දේශපාලනයෙන් තොර වූ සමුපකාරයටම මහත් කැළලක් වීම පමණක් නොව පාලකයන්ට සමුපකාරය නිවැරදි තේරුම් ගැනීමට නොහැකිවීම ද රටටම මහත් ව්‍යසනයක්ව පවතී. මේ පක්ෂ දේශපාලයෙන් මුදවා ගන්නා තෙක් සමුපකාරයේ වටිනාකම පාලකයින්ට නම් වැටහෙන්නේම නැත.

දිලිදු ජනතාව විශේෂයෙන්ම ධන බලයක් නැති හා නිලබලයක් නැති වරප්‍රසාද අහිමි ඇති ජනතාගේ අභිවෘද්ධිය සදහා, එකමුතුකම සදහාත් සංහිදියාව මෙන්ම එක්වීමේ බලය යහපතට යොදවන නිසාත් නිවැරදිව තේරුම සමුපකාරය ශක්තිමත් කිරීම යනු රජයක් කළ යුතු සේවාවන් කොටසක් සමුපකාරයට පැවරීමය. සාමාජිකයින්ට විනිවිද පෙනෙන පරිදි සියල්ල සිදුවන විට දූෂණයෙන් ද තොර වේ. සමාජ සාධරණය ද ඉටුවේ.

මෙවැනි අර්ථ ක්‍රමයක් ජාතික සංවර්ධනයට යොදවා ගත හැකි අන්දම ඉහත සදහන් කළ කොමිෂම විසින් මැනවින් නිර්දේශ කර ඇතත්, එය ක්‍රියාවට නැගිය යුත්තෝ කියවා බලන්නේවත්, විමසා බලන්නේවත් නැත.

## සී.ස. රත්මල්දෙණි ළමා සමිතිය

### විශ්ව ළමා දින සැමරුම් උත්සවය




රත්මල්දෙනිය සණස සමිතියේ ළමා සමාජය වාර්ෂිකව පවත්වනු ලබන විශ්ව ළමා දිනය කාන්තා කමිටු සභාපතිනි පී. සුනේත්‍රා මහත්මියගේ මූලිකත්වයෙන් උත්සවාකාරයෙන් සමරන ලදී. මෙදින දරුවන්ගේ නැටුම් ගැයුම් ආදියෙන් උත්සවය වර්ණවත් විය. අවසානයේ සියළු දරුවන් වෙනුවෙන් සංග්‍රහයක් හා ත්‍යාග ප්‍රධානයක් සිදුකරන ලදී.

සමිතියේ දුවා දරුවන්ට ආදර්ශයක් වන පරිදි එදිනට යෙදිතිබු වැඩිහිටි දිනය වෙනුවෙන් වැඩිහිටියන් දෙපලකට ත්‍යාග පිරිනැමීමක්ද සිදුකරන ලදී.

**බී. මානෙල් පෙරේරා**

# පින් ලබන්නෝ සහ නොලබන්නෝ

මෙලොවින් චුතව පරලොව ගිය අය පිළිබඳව විවිධ අයගේ විවිධ මත පවතී. පරලොව ගිය අයට පින් අනුමෝදන් කරවීම පිළිබඳව ද විවිධ අදහස් මතවාද සමාජය තුල පවතී. මෙහිදී පරලොව ගිය සෑම දෙනාටම පින් අනුමෝදන් වීමට පුළුවන්ද? සියලු දෙනාට දෙන පින් අනුමෝදන් වෙයිද? පින් ගැනීමට තරම් සුදුසු තත්වයක ඔවුන් ඉපදී සිටිත්ද? විශාල මුදලක් වියදම් කර අධික මහන්සියක් වී වෙහෙසක් දරා පින්කම් කර පින් අනුමෝදන් කළද එම පින් අනුමෝදන් වීමට නොහැකි වුයේ නම් මෙම පින් අපතේ යනවා නේද? යන මෙම කුකුෂ බොහෝ දෙනා තුළ පවතී. ඉහත සදහන් කෙබඳු මතවාදයන් තිබුණද එම පින්දීම ආරම්භ වූයේ බුද්ධත්වයෙන් පළමු වර්ෂයේ දීමය. බුදුපියාණන් වහන්සේට පළමුවෙන්ම ආරාමයක් පූජා කරන ලද්දේ බිම්බිසාර මහ රජතුමා විසිනි. ඒ වේළුවනාරාමයයි. වේළුවනාරාමය බුදුරදුනට පූජා කර මහ සඟ රුවනට දන් පිරිනමන ලද පසුව බුදු පියාණන් අනුමෙවෙනි දම් දෙසන ලදී. පින් අනුමෝදන් කිරීමේ චාරිත්‍රය ඒ වන විට ශාසනයෙහි නොතිබුණ හෙයින් බිම්බිසාර මහරජතුමාගෙන් එම යුතුකම ඉටු නොවීය. එතුමාගේ ඉතා දිගු පෙර ජාතිවල නෑදෑයන් වු දහස් ගණන් මියගිය පිරිසක් බුද්ධාන්තරයක් මුළුල්ලේ බලාපොරොත්තුවෙන් සිට එතුමා වෙත එදින පින් ගැනීමට පැමිණ සිටියහ. නමුත් පින් නොලැබුණ හෙයින් එදින රාත්‍රියේ ඔවුන් එතුමාට දර්ශනය විය. රජතුමා පසුදින බුදුරදුන් වෙත ගොස් මේ පුවත සැල කර සිටියහ. බුදුපියාණන් රජතුමාට කරුණු පැහැදිලි කර ඔවුන්ට පින් දෙන ලෙස නියම කළහ. රජතුමා පසු දින මහ සඟරුවනට දන් පූජා කර මළගිය තම පාරම්පරික නෑදැයින්ට පින් අනුමෝදන් කරන ලදී. පසුදින ඔහු ආහාර පාන ලබා තිබුණද ඇඳුම් පැළඳුම් නොලබා නිර්වස්ත්‍රව දර්ශනය විය. මේ පුවත බුදුපියාණන් වහන්සේට දැන්වු පසුව බුදුපියාණන් රජතුමාට සැළකර සිටියේ දන් දී පිරිකර ලෙස වස්ත්‍ර පූජා කරන ලෙසටය. රජතුමා එලෙස කටයුතු කරන ලදී. පසුව ඔවුන් ආහාර ද වස්ත්‍ර ද ලබා දර්ශනය විය. මෙයින් බුදුපියාණන් අනුදැන වලාලේ දන් දී පිරිකර පුජා කළයුතු බවයි. පින් ලබන අය සහ පින් නොලබන අය පිළිබඳව බුදු රජාණන් වහන්සේ දේශනා කර ඇති තිරෝකුඩ්ඩ සූත්‍රයේ මේ පිළිබඳව ඉතා සවිස්තර විස්තරයක් ඇත. මෙම සූත්‍රයෙන් ප්‍රේතයන් පිළිබඳ අපූරු විවරණයක් ඉදිරිපත් කර ඇත. ප්‍රේතයන් පිළිබඳව විවිධ මත හා විශ්වාස බෞද්ධයන් අතර ඉතා ඈත අතීතයේ පටන්ම පැතිර පවතී. එය බෞද්ධයන්ගේ ජීවිත හා බැඳී පවතී. මේ මිනිසුන් විසින් සිදුකරන කුසල් අකුසල් හොඳ නරක මත අප බෞද්ධයන්ට මෙම ප්‍රේත සංකල්පය මත ඇතිවී ඇත. අයහපත් දේ කරන අය මරණින් මතු නරකයෙහි ප්‍රේත ලෝකවල උපදින බවත් හොඳ දේ කළ අය මරණින් මතු හොඳ භවවල උපත ලබන බවත් බෞද්ධ විශ්වාසයයි. මේ බව බුදු දහමේ විස්තර වෙයි. ''කායේන දුච්චරිතං චරති. කායස්ස භේදා අපායං දුග්ගතිං. විනීත පායස්ස නිරයං උප්පජ්ජති'' එසේම ''කායේන සුචරිතං චරති කායස්ස භේදා පරං මරණං සුගති සග්ගං ලොකං උප්පජ්ජති'' මෙසේ තම තමා කරන ලද හොඳ නරක අයත් භවය සකස් කරන බව බුදුදහමේ ඉගැන්වීමයි. මෙම ප්‍රේතයන් පිළිබඳව රසවත් කථා රාශියක්ම ප්‍රේත වස්තුවේ සඳහන් වන අතර දිව්‍ය ගති පිළිබඳව රසවත් කතා රාශියක් විමානවස්තුවේ සඳහන් වේ.

මේ අනුව විමානවත්තු ප්‍රේත වස්තු පරිශීලනය කිරීමේදී මෙම ප්‍රේත ලෝක සහ දිව්‍ය ලෝක පිළිබඳව රසවත් තොරතුරු රාශියක් දැකිය හැකිය.

මෙහිදී පිං ලබන නොලබන අය පිළිබඳව ද තොරතුරු ප්‍රේතදූත සූත්‍රයෙන් සොයාගත හැකිය. දිනක් ජානුස්සොනීය බ්‍රාහ්මණයා බුදුන් වෙත පැමිණ බුදුපියාණන් වහන්සේගෙන් මෙසේ විමසා සිටියා. ''භවත් ගෞතමයාණන් වහන්ස, අපි මිය ගිය අය සිහිකර දන් පුජා කර මේ පින් මියගිය අසවලා සඳහා අනුමෝදන් වේවා කියා පිං අනුමෝදන් කරමු. නමුත් මෙම පිං ඔවුන් අනුමෝදන් වෙත්ද? මෙම පැනයට පිළිතුරු වදාළ බුදුපියාණන් වහන්සේ එදා වදාලේ බමුණ ස්ථානයේ එය ලැබෙයි. අස්ථානයේ එය නොලබයි යනුවෙනි. මෙහිදී බමුණා එය පිළිබඳව බුදුපියාණන් වහන්සේගෙන් විස්තර විමසූ විට බුදුපියාණෝ ස්ථානය හා අස්ථානය මෙසේ විස්තර කළ සේක. යමෙකු දස අකුසල් සිදුකර මිය ගිය විට ඔහු නරකයෙහි උපදී. නරකාදියේ උපත ලබන්නෝ නරකාදියේ ඇති අහරක් නිසා ජීවත්වෙයි. ඔහු පින් නොලබයි. මේ අස්ථානයයි. මෙයින් විස්තර වන්නේ නිරයේ උපදින සත්වයින්ට පිං අනුමෝදන් විය නොහැකි බවයි. එසේම මෙම සූත්‍රයට අනුව මිනිස් ලොව උපදින අයට ද තිරසන් ගත සතුන්ට ද පින් අනුමෝදන් විය නොහැකි බව කියවෙයි. සතර වැදෑරුම් ප්‍රේතයින්ගෙන් ''සෘතුප ජීවි ක්ෂුත් පිපාසීය'' නිජ්ඣාමා තණ්හාතිකය යන ප්‍රේත ලෝකවල උපදින ප්‍රේතයෝ පින්ඵල නොලබති. ස්ථානය ලෙස බුදුපියාණන් වහන්සේ වදාලේ පරදත්තූපජීවී ප්‍රේත ආත්මයි. ඔවුන්ට පින්ඵල සිහිකර අනුමෝදන් කිරීමේදී අනුමෝදන් විය හැක. මළවුන් පිළිබඳ එහි විස්තරය බුදුසමයේ ඉතා ප්‍රකට ප්‍රවෘත්තියකි.

''තිරෝ කුඩ්ඩෙසු තිට්ඨන්ති
සන්ධි සිංඝාමි කෝසුච

ද්වාර භාහාසු චිත්තංති
ආගන්ත්වාන සඛංඝරං''

යන තිරොකුඩ්ඩ සූත්‍රයේ දැක්වෙන මෙම විස්තරයෙන් පැහැදිලි වන්නේ මියගියවුන් තම පැරණි නිවස කරා පැමිණ බිත්තියට පිටතද ගෘහ සන්ධි, බිත්ති සන්ධි, සතරමං සන්ධි, තුංමං සන්ධි යන ස්ථානවල රැඳෙමින් තම නිවස යන හැඟීමෙන් දැනීමෙන් සිටින බවයි. මේ නිසා මෙම විස්තරවලට අනුව පෙනී යන්නේ පරලොව යන හැමටම පින් අනුමෝදන් වීමේ හැකියාවක් නොමැති බවයි. පරදත්තූපජීවී කොට්ඨාශයේ උපත ලබා ඇති අය පිං අනුමෝදන් වන බවත්ය. නමුත් පිං අනුමෝදන් කළ විට පිං ගැනීමට කිසිවකු නොසිටියද එම පිං තමාට ලැබෙන බව 'තුම්හේහි පුඤ්ඤං පසුතං අනප්පකං' එම පිං තමා පසුපස එන බව සදහන් වේ.



**දොන් ජයපාල විජේරත්න**
**වැලිවිට මාලබේ සණස සමිතියේ හිටපු සභාපති සහ හිටපු කලාපීය අධ්‍යක්ෂක**

# මිණිමුතු ළමා සමාජයේ ප්‍රථම ළමා දින සැමරුම



ජාත්‍යන්තර ළමා දිනය මුලික කරගනිමින් නාවල මැද සණස සමිතියේ කාන්තා කමිටුවේ මුලිකත්වයෙන් ප්‍රථම වරට 'මිණිමුතු ළමා සමාජයේ' සාමාජික සාමාජිකාවන්ගේ චිත්‍ර, ගායනා සහ රචනා තරඟාවලියක් 2019 ඔක්තෝම්බර් 6 වන ඉරුදින සමිති පරිශ්‍රයේදී පවත්වන ලදී.

එහිදී ජයග්‍රාහකයන් හට විශේෂ ත්‍යාගයන් හා සහභාගි වූ සියළුම ළමා සාමාජිකයන් හට ත්‍යාග ප්‍රධානයක් ද සිදුවිය. තවද කොළඹ දිස්ත්‍රික් ස.ණ.ස. සංගමය මගින් පවත්වනු ලැබූ සාහිත්‍ය තරඟාවලිය සදහා ප්‍රථම වතාවට අප සමිතියෙන් සහභාගි කර වූ ළමුන් සදහා ත්‍යාග ප්‍රධාන කිරීමක්ද සිදු කරන ලදී.

මහසභා සාමාජිකයන්ගේ නොමද පැසසුම් මෙම වැඩසටහන සදහා හිමිවූ අතර ළමා සාමාජිකයන්ගේ සතුටු සිනා මැද වැඩසටහන අවසන් කලහ.





## වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබද දැනුවත් කෙරේ...



**හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිපුණතා සංවර්ධන නිලධාරී වසන්ත උග්ගල්ල මහතා වෘත්තීය මාර්ගෝපදේශනය පිලිබද දැනුවත් කිරීම.**

සීමාසහිත දිගම සණස සමිතියේ සාමාජිකයින් සදහා හා ඔවුන්ගේ පවුල්වල රැකියාවන් අපේක්ෂිවෙන් සිටින තරුණ තරුණියන්ට සුදුසු වෘත්තීමය පුහුණුවකට යොමු කිරීමේ අරමුණින් වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබද දැනුවත් කිරීමක් පසුගියදා සිදුකෙරින.

මෙම වෘත්තීමය මාර්ගෝපදේශනය පිලිබද දැනුවත් කිරීම සදහා සම්පත් දායකත්වය ලබාදෙන ලද්දේ හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිපුනතා සංවර්ධන නිලධාරී වසන්ත උග්ගල්ල මහතා විසිනි.

**චමිලා ජයතුංග - දියගම සණස ලේකම්**

## ධර්ම දේශණය

සීමාසහිත දියගම සණස සමිතියේ වාර්ෂිකව පොසොන් පොහොය නිමිත්තෙන් සංවිධානය කරන ලද ධර්ම දේශණය පොසොන් පොහොය දින දියගම ශ්‍රී සාල වනෝද්‍යානාරාම විහාරස්ථාන යේදී පැවැත්වින.

මෙදින දේශකයානෝ වුයේ මොරැද ශ්‍රී ජයවර්ධනාරාම විහාරස්ථානයේ විහාරාධිකාරී කැස්බෑව ධර්මසේන ආටිගල බාලිකා විද්‍යාලයේ ධර්මාචාර්ය තල්දෙන පියරතන හිමිපාණන්ය.

ධර්ම දේශනය අවසානයේ ශීල සමාදන් වු උපාසක උපාසිකාවන් සදහා ගිලන්පස පිරිනැමීමද සිදුකෙරින.

සණස සමිතියේ කාරක සභික නිලධාරීන් ඇතුළු සාමාජික සාමාජිකාවන් විශාල පිරිසක් මෙම පිංකමට දායකවූහ.





**චමිලා ජයතුංග - දියගම සණස ලේකම්**